1

ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ පසුබෑමෙන් අනතුරුව ශක්තිමත් ලෙස නැගී සිටියේය. ආර්ථිකයේ ප්‍රධාන අංශ පුළුල් ලෙස යථා තත්ත්වයට පත්වෙමින්, 2021 වසරේ පළමු භාගයේ දී මූර්ත ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 8.0%කින් වර්ධනය විය. රජය සහ මහ බැංකුව විසින් පුළුල් පරාසයක විහිදුණු ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත ලබා දෙන ලද සුවිශේෂී ප්‍රතිපත්ති උත්තේජන, දීපව්‍යාප්ත එන්නත්කරණ වැඩසටහන හා සමගාමීව තෝරාගත් සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම සහ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත්වීම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා හේතුවිය. අනෙකුත් ඍජු මූල්‍ය පහසුකම් සපයන අතර, ලිහිල් බදු ක්‍රමයක් හඳුන්වා දෙමින් 2019 වසර අවසානයේ දී ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ග රජය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත ලබා දුන් විශාල පරිමාණයේ ණය සහන 2021 වසරේ දී තවදුරටත් ලබා දුන් අතර, එමගින් වසංගත ව්‍යාප්තියේ රැලි කිහිපයක් මධ්‍යයේ ආර්ථිකයේ පාර්ශ්වකරුවන් මුහුණ දුන් මූල්‍ය ප්‍රවාහ අවහිරතා මගින් ඇති කළ බලපෑම යම්තාක් දුරට සුමටනය කිරීමට උපකාරී විය. 2020 වසර තුළ දී මහ බැංකුව විසින් ලබා දුන් පෙර නොවූ අන්දමේ මුදල් ප්‍රතිපත්ති සහාය මෙන්ම, 2021 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය මැද දක්වා එම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යෑම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉතිහාසයේ පැවති අඩුම මට්ටම් දක්වා පහළ ගිය අතර, එමගින් ආර්ථිකය යළි නගා සිටුවීමට අවශ්‍ය ආයෝජන සඳහා පහසුකම් සලසමින් ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත ණය ලබා දීම සිදු විය. ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත වූ සීමිත ප්‍රවේශය මධ්‍යයේ දේශීය වෙළඳපොළ පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීමේ වාතාවරණය තුළින් රාජ්‍ය මූල්‍ය කටයුතු සඳහා ප්‍රතිලාභ අත් විය. තවද, වසංගතය හමුවේ පුළුල් වූ මූල්‍යන පරතරය පියවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම තුළින් මහ බැංකුව විසින් රජය වෙත විශාල අරමුදල් ප්‍රමාණයක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, විදේශීය අංශයේ අසමතුලිතතා සඳහා පිළියම් යොදන අතරම, මැදි කාලීනව ඇති විය හැකි උද්ධමනාත්මක පීඩන වළක්වා ගැනීම සඳහා 2021


දෛනිකව වාර්තා වන රෝගීන් සංඛ්‍යාව
ජනගහනයෙන් පූර්ණ එන්නත්කරණයට ලක් වූ කොටස (2021 ඔක්. 29 දිනට 61.2%කි)
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
(කාර්තුමය, වාර්ෂික ලක්ෂ්‍යමය)
2019 සිව්වන කාර්තුව 1.6%
2020 දෙවන කාර්තුව -16.4%
2021 ප්‍රථම කාර්තුව 4.3%
2021 දෙවන කාර්තුව 12.3%
සමස්ත අන්තර්ජාල සබඳතා 55.2% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2021 ජූනි අවසානයට)
භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය 7.3% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2021 ජන.-සැප්.)
බහලු මෙහෙයුම් ප්‍රමාණය 3.5% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2021 ජන.-සැප්.)
ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යෑමට සාපේක්ෂව ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිත සහ එල්.පී. ගෑස්වල මිල ගණන් සංශෝධනය විය
ආර්ථිකයේ වර්ධන විභවතාව සහ එහි ගමන් මග වැඩිදියුණු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක විය...
අධිවේගී මාර්ග සහ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හරහා ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම
කොළඹ වරාය නගරය ආශ්‍රිතව ප්‍රධාන නීති සම්පාදනය කිරීම සහ ඛනිජ තෙල් සම්පත් ගවේෂණය කිරීම තුළින් විදේශ ආයෝජන සඳහා ආකර්ෂණය වැඩි කිරීම
2021 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්ව ඇති අතර, කොවිඩ්-19ට එරෙහි ශීඝ්‍ර එන්නත්කරණ වැඩසටහන සහ සුදුසු රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල පසු බලපෑම් මගින් ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ...
ශ්‍රී ලංකා රුපියල තරගකාරී මට්ටමක පවතී...
විනිමය අනුපාතිකය (රු./එ.ජ.ඩො.)
මූර්ත සඵල විනිමය අනුපාතිකය -24
ජන.-21 පෙබ.-21 මාර්.-21 අප්‍රේ.-21 මැයි-21 ජූනි-21 ජූලි-21 අගෝ.-21 සැප්.-21 ඔක්.-21
2021 වසරේ ජූනි සිට අගෝස්තු දක්වා මාසවල එ.ජ.ඩො. බිලි. 1ට වඩා වැඩි වෙළඳ භාණ්ඩ අපනයන වාර්තා විය
අපනයන (එ.ජ.ඩො. මිලි.)
937 952 1,094 818 892 1,007 1,104 1,100
1,592 1,524 1,926 1,707 1,607 1,659 1,710 1,687
ආනයන (එ.ජ.ඩො. මිලි.)
ජන.-21 පෙබ.-21 මාර්.-21 අප්‍රේ.-21 මැයි-21 ජූනි-21 ජූලි-21 අගෝ.-21
2021 වසරේ ජූලි මාසයේ දී එ.ජ.ඩො. බිලි. 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ගෙවීම
චීන මහජන බැංකුව සහ බංගලාදේශ බැංකුව සමඟ, පිළිවෙළින්, එ.ජ.ඩො. බිලි. 1.5කට සමාන සහ එ.ජ.ඩො. මිලි. 200ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට එළඹීම
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලැබුණු එ.ජ.ඩො. මිලි. 787කට සමාන විදේශ ගැනුම් හිමිකම් වෙන් කිරීම
ගෝලීය සංචරණ කටයුතු ඉහළ යෑම සහ ලොව පුරා කොවිඩ්-19ට එරෙහිව සාර්ථක එන්නත්කරණ වැඩසටහන් දියත් කිරීම හේතුවෙන් සංචාරක කර්මාන්තය වර්ධනය විය
විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ (ජන.-සැප්.)
2020 එ.ජ.ඩො. බිලි. 5.0
2021 එ.ජ.ඩො. බිලි. 4.6
සංචාරක පැමිණීම්
ජන.-21 1,682
පෙබ.-21 3,366
මාර්.-21 4,581
අප්‍රේ.-21 4,168
මැයි-21 1,497
ජූනි-21 1,614
ජූලි-21 2,429
අගෝ.-21 5,040
සැප්.-21 13,547
දළ නිල සංචිත
2020 වසර අවසානයට
එ.ජ.ඩො. බිලි. 5.7
2021 සැප්. අවසානයට
එ.ජ.ඩො. බිලි. 2.7
විදේශීය ජංගම ගිණුමේ ශේෂය (ජන.-ජූනි)
2021 එ.ජ.ඩො. බිලි. -1.5
2020 එ.ජ.ඩො. බිලි. -1.1
කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ දැඩි අභියෝගවලට මුහුණ දුන් විදේශීය අංශය, මහ බැංකුවේ සහ රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරි කාලය තුළ ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ...
ශ්‍රී ලංකාවේ ආර්ථිකය
යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ගැළපුම් සිදු කිරීමත්, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ඉදිරි කාලය තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂිතය...
ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ
(ද.දේ.නි.යේ %, ජන.-ජූලි)
2021 -4.7%
2020 -4.6%
වර්තන ගිණුමේ ශේෂය
-2.3%
-1.9%
ප්‍රාථමික ශේෂය
-6.2%
-5.8%
සමස්ත අයවැය ශේෂය
විදේශීය ණය ප්‍රමාණය මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස
40.0% (2020 අවසානයට)
38.4% (2021 ජූලි අවසානයට)
කොවිඩ්-19 ආශ්‍රිත වියදම්
ආදායම (ද.දේ.නි.යේ %)
ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ විශේෂ භාණ්ඩ හා සේවා සඳහා සංයුක්ත බද්දක් ක්‍රියාත්මක කිරීම සහ බදු සමාවක් ලබා දීම
9.1% 2020 ජන.-ජූලි 5.1%
11.8% (ඇස්තමේන්තුගත) 2021 ජන.-ජූලි 4.9%
වියදම (ද.දේ.නි.යේ %)
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීමට කටයුතු කිරීම
20.3% 2020 ජන.-ජූලි 10.9%
21.4% (ඇස්තමේන්තුගත) 2021 ජන.-ජූලි 11.0%
මූලය: මුදල් අමාත්‍යාංශය


මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය) වසර 12කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමේ පැවතුණි...
10%
1980
1984
1988
1992
1996
2000
2004
2008
2012
2016
2020
ජන.-20
අප්‍රේ.-20
ජූලි-20
ඔක්.-20
ජන.-21
අප්‍රේ.-21
ජූලි-21
ඔක්.-21
6%
4%
සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමඟ මැදි කාලීනව උද්ධමනය 4-6% අතර පරාසයේ පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ...
ආහාර කාණ්ඩයේ උද්ධමනය
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)
12.8% කො.පා.මි.ද. ඔක්. 21
10.0% ජා.පා.මි.ද. සැප්. 21
ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)
5.4% කො.පා.මි.ද. ඔක්. 21
3.0% ජා.පා.මි.ද. සැප්. 21
ගෝලීය වශයෙන් මිල ගණන් ඉහළ යෑම
(සැප්. 21 අවසානය දක්වා)
↑ 53.0% බොරතෙල් (බ්‍රෙන්ට්)
↑ 45.5% එල්.පී. ගෑස්
↑ 17.7% කිරිපිටි (තොග)
GAS
Milk
ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ අවහිරතා හා ගෝලීය මිල ප්‍රවණතා මෙන්ම ඉල්ලුම් පීඩන ක්‍රමයෙන් වර්ධනය වීම හේතුවෙන් උද්ධමනය මෑත මාසවල දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය...
මුදල් සැපයුම - M_{2b}
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)
7.0% 2019
23.4% 2020
21.0% 2021 අගෝ. අවසානයට
එක් දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව
2021 සැප්. අවසානයට රු. බිලි. -120
2020 අවසානයට රු. බිලි. 207
4.2% 2019 රු. බිලි. 236
6.5% 2020 රු. බිලි. 374
15.1% 2021 ජන.-අගෝ. රු. බිලි. 625
පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)
2021 ජන.-අගෝ. රු. බිලි. 135
2020 රු. බිලි. 184
2019 රු. බිලි. 63
2021 ජන.-අගෝ. රු. බිලි. 1,134
2020 රු. බිලි. 1,752
2019 රු. බිලි. 279
රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රසාරණය
2021 වසරේ අගෝස්තු මාසය මැද දී ඇතැම් සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති උත්තේජන ආපසු හැරවීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී...
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
9.00%
8.00%
6.00%
6.00%
5.00%
4.00%
2018 අවසානය
2019 අවසානය
2020 අවසානය
2021 සැප්. අවසානය
දෙසැ.-18 8.95%
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (මාසය අවසානයේදී)
ඔක්.-20 4.53%
සැප්.-21 5.94%
දෙසැ.-18 10.01%
දින 91 භාණ්ඩාගාර බිල්පත් (මාසය අවසානයේදී)
සැප්.-20 4.51%
සැප්.-21 6.70%
දෙසැ.-18 8.81%
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය
සැප්.-21 4.75%
දෙසැ.-18 14.40%
බරිත සාමාන්‍ය ණය අනුපාතිකය
සැප්.-21 9.37%
අභියෝගාත්මක දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික තත්ත්වයක් පැවතිය ද, මූල්‍ය පද්ධතිය ශක්තිමත්ව පැවතුණි...
2021 වසරේ පළමු භාගය අවසාන වන විට විවිධ අංශ වෙත සපයන ලද ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)
13.0% කෘෂිකර්මාන්තය
11.3% කර්මාන්ත
9.2% සේවා
පෞද්ගලික ණය සහ අත්තිකාරම් 19.4%
1.8% වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර)
4.7% දළ අක්‍රීය ණය අනුපාතය
36.1% ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක)
18.0% ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)
20.6% තැන්පතු වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)
බැංකු අංශය
(2021 අගෝ. අවසානයට)
බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය
(2021 අගෝ. අවසානයට)
16.7% ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
3.2% වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
12.5% දළ අක්‍රීය ණය අනුපාතය
2021 වසරේ ඔක්තෝබර් මාසයේ කොළඹ කොටස් වෙළඳපොළේ සමස්ත කොටස් මිල දර්ශකය ඉතිහාසයේ ප්‍රථම වතාවට ඒකක 10,000 සීමාව ඉක්මවා ගියේය...
2018 අවසානයට 6,052.37
2019 අවසානයට 6,129.21
2020 අවසානයට 6,774.22
2021 ඔක්. අවසානයට 10,162.93
දළ ලියාපදිංචි වාරිකයෙහි වර්ධනය 10.7%
ප්‍රතිලාභ වර්ධනය (බදු පෙර) -20.1%
මුළු වත්කම්වල වර්ධනය 7.9%
රක්ෂණ අංශය
(වාර්ෂික ලක්ෂ්‍යමය, 2021 ජූනි අවසානයට)

වසරේ අගෝස්තු මාසය මැද දී ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (2021 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි) ඉහළ නංවමින් මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට පියවර ගත්තේය. වෙළඳ භාණ්ඩ අපනයන, වසංගතයට පෙර පැවති මට්ටම් දක්වා ළඟා වූ අතර, ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත්වීම මෙන්ම, ගෝලීය වෙළඳපොළ තුළ සියලුම ප්‍රධාන වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම නිරූපණය කරමින් ආනයන වියදම ද ඉහළ ගියේය. වසංගත තත්ත්වය තුළ විදේශ විනිමය ප්‍රවාහ ගලා ඒම සීමා වීම මධ්‍යයේ, සමපේක්ෂණ ක්‍රියාකාරකම් මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ තවදුරටත් පීඩනයක් ඇති කළ අතර, ඒ හේතුවෙන් අපනයන ඉපැයීම් රුපියල් බවට පරිවර්තනය කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතා පැනවීමට, විදේශ විනිමය අනුපාතික නිර්ණය සඳහා මාර්ගෝපදේශ සැපයීමට, සහ ඉන් අනතුරුව අත්‍යවශ්‍ය ආනයන වෙනුවෙන් මූල්‍ය සහාය සැපයීම සඳහා මැදිහත් වීමට මහ බැංකුවට සිදු විය. මේ අතර, දිගු කලක සිට පසුබෑමට ලක් වී ඇති සංචාරක කර්මාන්තය හේතුවෙන් සේවා වෙළඳාම් අංශයේ ක්‍රියාකාරිත්වය දුර්වල ව පැවති අතර, ගෝලීය සංචාරක කටයුතු නැවත ආරම්භ වීම සහ කොවිඩ්-19 සඳහා වූ එන්නත්කරණ වැඩසටහන් වේගවත් වීමත් සමඟ එම අංශය වේගයෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රටවල් අතර සංචරණය යළි ආරම්භ වීම, විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වන සංඛ්‍යාව අඩු වීම, සහ බැංකු පද්ධතියෙන් පරිබාහිරව විනිමය ප්‍රතිලාභ සෙවීමත් මූලික වශයෙන් පිළිබිඹු කරමින්, වසංගතය මධ්‍යයේ ස්ථාවරව පැවති විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් මෑත මාසවල දී මන්දගාමී විය. විදේශීය අංශය තුළ මෑත කාලීනව ඉහළ ගිය අවදානම් සහ විදේශ විනිමය ප්‍රවාහ මන්දගාමී වීම හේතුවෙන් මූල්‍ය පද්ධතිය තුළ දක්නට ලැබුණු පීඩන සඳහා රජයේ සහ මහ බැංකුවේ ඒකාබද්ධ ප්‍රයත්න මගින් විසඳුම් ලබා දීම සිදු වේ. වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන මෙන්ම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලෙස ද ලැබෙන රටේ විදේශ විනිමය ඉපයීම් ප්‍රවර්ධනය සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. මෙම ප්‍රයත්නවල සහාය ඇතිව විදේශීය ජංගම ගිණුමේ ශේෂය මැදි කාලීනව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහා පරිමාණ ව්‍යාපෘති සඳහා වන විදේශ ඍජු ආයෝජන හා උපායමාර්ගික නොවන වත්කම් මුදල් වටිනාකම් බවට පරිවර්තනය කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග මගින් ඉදිරි කාලය තුළ දී රජය වෙත සැලකිය යුතු මට්ටමේ ණය නොවන විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින්, දැනට සාකච්ඡා මට්ටමේ පවතින මූල්‍ය පහසුකම්හි සහාය ද ඇතිව, විදේශ ණය සේවාකරණය සඳහා පහසුකම් සැපයෙනු ඇත. කෙටි කාලීන විචලනයන් පැවතිය ද, දළ නිල සංචිත ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ප්‍රමාණවත් මට්ටම් දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක මගින් පෙන්නුම් කරන පරිදි විනිමය අනුපාතික අඛණ්ඩව තරගකාරී මට්ටමක පවතී. ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන ඇතුළු විවිධ පාර්ශ්වයන් විසින් ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණ ශක්‍යතාව පිළිබඳව සිදුකරන ලද සමපේක්ෂණ හමුවේ වුවද, රජය සියලුම විදේශ විනිමය වගකීම් පියවීය. මේ අතර, වසංගතය හමුවේ පුළුල් වූ අයවැය හිඟය, ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීම සහ රජයේ සැලසුම්ගත වියදම් තාර්කිකරණය කිරීම සමඟ මැදි කාලීනව අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ප්‍රධාන වශයෙන් ආහාර මිල ගණන් අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම, පරිපාලිත මිල ගණන් කිහිපයකට සිදු කළ සංශෝධන සහ ගෝලීය භාණ්ඩ මිල ගණන් ඉහළ යෑමට සමගාමීව තෝරාගත් ආනයන භාණ්ඩවල මිල පාලන ලිහිල් කිරීම හේතුවෙන් මතුපිට උද්ධමනය 4-6% අතර ඉලක්කගත පරාසයේ ඉහළ සීමාව අභිබවා ගියේය. ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්වයන් ශක්තිමත් වීම පිළිබිඹු කරමින්, මෑත කාලයේ දී මූලික උද්ධමනය ද ඉහළ ගියේය. කෙටි කාලීනව මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පැවතිය හැකි වුවද, අවශ්‍ය පරිදි සුදුසු පූර්වෝපායික ප්‍රතිපත්ති තුළින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ, මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත පරාසය තුළ පවත්වාගෙන යමින් ආර්ථිකයට එහි විභව වර්ධන මාවත වෙත ළඟා වීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහතික කිරීමට මහ බැංකුව කැප වී සිටියි. වසංගතයේ බලපෑමට ලක්වූ ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා ගනු ලැබූ පියවර මධ්‍යයේ, දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ සහාය ඇතිව, අපනයනාභිමුඛ නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් විවිධාංගීකරණය සඳහා වූ රජයේ ප්‍රයත්න, මැදි කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන ගම්‍යතාව තිරසාරව පවත්වා ගැනීමට සහ ආර්ථිකයේ ස්ථාවර බව වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇත.

1.1 ආංශික වර්ධනයන්

මූර්ත අංශය සහ උද්ධමනය

වසංගතය හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සැලකිය යුතු පසුබෑසීමට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගය තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා වූ 9.1%ක පසුබෑසීමට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 8.0%ක මූර්ත වර්ධනයක් පෙන්නුම් කළේය.

> **වේගවත් කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන හරහා වසංගතය කඩිනමින් පාලනය කිරීමත් සමඟ රජය සහ මහ බැංකුවේ පෙර නොවූ අන්දමේ ප්‍රතිපත්තිමය සහාය ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත්වීමට උපකාරී විය...**

පසුගිය වසරේ අනුරූප කාලයට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගය තුළ ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ සැලකිය යුතු හිතකර වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.1%ක සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කළ අතර, මෙම කාලය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන්, විශේෂයෙන් ම, තේ, තෙල් සහිත පලතුරු භෝග, රබර් සහ පලතුරු වගා කටයුතු වර්ධනය විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 14.6%ක පසුබෑසීමට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගය තුළ දී කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල අගය එකතු කිරීම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.1%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාකාරකම් හැර කර්මාන්ත අංශයේ සියලුම උප අංශවල වර්ධනය ධනාත්මක විය. සංචරණ සීමා ලිහිල් කිරීමෙන් ලද සහායත් සමඟ, 2021 වසරේ පළමු භාගයේ දී, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් උප අංශ 9.9%කින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය විය. තවද, 2021 වසරේ පළමු භාගයේ දී කාර්මික නිෂ්පාදන කටයුතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 14.0%ක

1.1 රූප සටහන
කාර්තුමය මූර්ත ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් හා සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන, ආහාර, බීම වර්ග හා දුම්කොළ නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ, සහ වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය යන උප අංශ මෙයට දායක විය. සේවා ක්‍රියාකාරකම්, 2020 වසරේ පළමු භාගයේ 5.2%ක පසුබෑසීමට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 5.1%ක මූර්ත වර්ධනයක් සමඟ ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කළේය. සේවා අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ මූල්‍ය සේවා සහ මූල්‍ය අතරමැදි සේවා ක්‍රියාකාරකම්, ගබඩා පහසුකම් සැපයීම ඇතුළු භාණ්ඩ හා මගී ප්‍රවාහනය, තොග සහ සිල්ලර වෙළඳාම, නිවාස අයිතිය ඇතුළු දේපළ වෙළඳාම් කටයුතු, වෙනත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම් සහ විදුලි සංදේශ සේවාවන් ය. කෙසේ වුවත්, සංචරණ සීමා මධ්‍යයේ සංචාරක ක්‍රියාකාරකම් අඩාල වීම හේතුවෙන්, 2021 වසරේ පළමු භාගයේ දී නවාතැන් පහසුකම් හා ආහාරපාන ආශ්‍රිත සේවා යන සේවා ක්‍රියාකාරකම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 13.4%කින් සංකෝචනය විය.

ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ පළමු භාගයේ දී 13.8%කින් නාමික වශයෙන් වර්ධනය විය. දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) ඇස්තමේන්තුගත කිරීමේ වියදම් ප්‍රවේශයට අනුව, 2021 වසරේ පළමු භාගයේ දී ආර්ථික වර්ධනය සඳහා පරිභෝජන වියදමේ සිදු වූ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. ද.දේ.නියෙන් 84.9%ක් වූ පරිභෝජන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 2.9%ක පසුබෑසීමට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගයේ දී 16.5%ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය වූයේ ගෘහස්ත වියදම් සම්බන්ධයෙන්

ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමේ ආර්ථිකමය බලපෑම

මින් පෙර අත්විඳි සාර්ස් (SARS), H_1N_1 හෝ ඉබෝලා (Ebola) වැනි වසංගත අවස්ථාවල දී මෙන් නොව, කොවිඩ්-19 ව්‍යාප්ත වීම කෙටි කාලයක් තුළ ගෝලීය වසංගතයක් දක්වා වේගයෙන් විකාශය වීම නිසා ලොව පුරා රටවලට පෙර නොවූ ආකාරයෙන් ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමට සහ වෙනත් ආකාරයේ සංචරණ සීමා හඳුන්වා දීමට සිදු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ දී 3.1%කින් ගෝලීය ආර්ථිකය සංකෝචනය වීමෙන් එවැනි සීමා කිරීම්වල බලපෑම පිළිබිඹු වේ.

ශ්‍රී ලංකාව තුළ ද වසංගතය සහ ඒ ආශ්‍රිත ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම් හා සංචරණ සීමා මගින් ඇති කෙරෙන සමාජ-ආර්ථික බලපෑම් ඉහළ මට්ටමක පැවතුණි. 2020 වසරේ මාර්තු-මැයි කාලය තුළ දී වසංගතයේ පළමු රැල්ල, රට පුරා ආර්ථික හා සමාජ කටයුතු දැඩි ලෙස සීමා කිරීමෙන් පාලනය කෙරුණු අතර, ඉන් අනතුරුව ක්‍රමානුකූලව එම සීමා ලිහිල් කරන ලදී. රට පුරා ආර්ථික හා සමාජ කටයුතු දැඩි ලෙස සීමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 16.4%ක පසුබෑමක් වාර්තා කළේය. 2020 වසරේ ඔක්තෝබර්-නොවැම්බර් කාලය තුළ දෙවන රැල්ල මැඩලීම සඳහා තෝරාගත් ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම් සහ සංචරණ සීමා යොදා ගන්නා ලද අතර, එමගින් ආර්ථිකයේ බිඳවැටීම යම් ප්‍රමාණයකට සීමා විය. එහෙත්, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට බාධා ඇති වූ අතර, සිව්වන කාර්තුවේ දී ආර්ථික වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 1.3%කට සීමා විය. ඒ අනුව, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය පිළිබඳ පෙර පුරෝකථනය වන 5%ක පමණ අගයට සාපේක්ෂව, ශ්‍රී ලංකාව එහි ඉහළම ආර්ථික සංකෝචනය වන -3.6%ක අගයක් 2020 වසරේ දී වාර්තා කළේය. 2021 වසරේ අප්‍රේල් සිට දක්නට ලැබුණු වසංගතයේ තුන්වන රැල්ල මෙතෙක් පැවති විශාලතම ව්‍යාප්තිය විය. තුන්වන රැල්ල තුළ දී ද සුදුසු ලෙස තෝරාගත් සංචරණ සීමා ක්‍රියාත්මක විය.

වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ආර්ථික හා සමාජ කටයුතු තාවකාලිකව සීමා කර තැබීම සහ සංචරණ සීමා පැනවීම අවශ්‍ය වුවද, එමගින් සාර්ව ආර්ථික කාර්යසාධනය වෙත ඇති වූ බලපෑම ඉතා දැඩි විය. 2019 වසරේ අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් සිදු කරන ලද පුරෝකථනවලට අනුව, ශ්‍රී ලංකාවේ ද.දේ.නි.ය 2020 වසරේ දී රුපියල් ට්‍රිලියන 17.39ක සහ 2021 වසරේ දී රුපියල් ට්‍රිලියන 19.17ක මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරිණි. කෙසේ නමුත්, වසංගතයත් සමඟ ආර්ථිකයේ ද.දේ.නි.ය 2020 වසරේ දී රුපියල් ට්‍රිලියන 14.97ක් පමණක් වූ අතර, 2021 වසරේ දී එය රුපියල් ට්‍රිලියන 16.5ක් පමණ වනු ඇතැයි අපේක්ෂිතය. මෙමගින් නාමික ද.දේ.නි.යෙහි වාර්ෂික පාඩුව රුපියල් ට්‍රිලියන 2.5ක් පමණ අති විශාල අගයක් බව පෙන්නුම් කෙරේ.

ආර්ථිකයේ සෑම ප්‍රධාන අංශයකටම කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් මිදීමට නොහැකි වූ අතර, ජාත්‍යන්තර වෙළඳාම හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අදාළව විදේශ විනිමය උපයන ප්‍රධාන ක්ෂේත්‍ර වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇති බව සඳහන් කළ යුතුව ඇත. මෙම තත්ත්වය විදේශ විනිමය රට තුළට ගලා ඒම පහත වැටීම මගින් පිළිබිඹු කෙරෙන අතර, එමගින් විනිමය අනුපාතිකයේ ස්ථායිතාව මත අයහපත් බලපෑමක් ඇති වී ආයෝජකයන්ගේ විශ්වාසය මත අහිතකර බලපෑම් ඇති කරනු ලැබේ. රාජ්‍ය මූල්‍ය පිළිබඳව සැලකීමේදී, රජයේ වියදම් වැඩි වීම මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමී බව රජයේ ආදායම අඩු වීමට දායක වී ඇති අතර, එය රාජ්‍ය මූල්‍ය අංශයට සැලකිය යුතු පීඩනයක් ඇති වීමට සහ අමතර ණය ලබා ගැනීමට හේතු වෙයි.

ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම සහ සංචරණ සීමා පැනවීම මගින් සිදු වූ බලපෑම ශ්‍රම වෙළඳපොළ පැතිකඩ හරහා ද තක්සේරු කළ හැකිය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2020 වසරේ සිව්වන කාර්තුව සඳහා වූ ශ්‍රම බලකා සමීක්ෂණ කාර්තුමය වාර්තාවට අනුව, මිලියන 8.03ක් වන රැකියාවේ නියුතු මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස තමන්ගේම වැඩකටයුතු කරන්නන්, ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් සහ පුද්ගලික අංශයේ සේවකයන් ප්‍රමාණය 82%ක් විය. තවද, 2019 වසර සඳහා වූ වාර්ෂික ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාවට අනුව, අවිධිමත් අංශයේ රැකියා නියුක්තිකයන් මුළු රැකියා නියුක්තිකයන්ගේ ප්‍රතිශතයක් ලෙස 57.4%ක් විය. මෙයින් ඉස්මතු වනුයේ රැකියාවල නියැලෙන්නන් අතර පවා විශාල බහුතරයක් එවැනි බාධක හමුවේ අවදානමට ලක්වීමට ඉඩ ඇති බවය. තවද, අභ්‍යන්තර ගැටුම අවසන් වීමෙන් පසු වාර්තා වූ 4.4%ක සාමාන්‍ය විරැකියා අනුපාතිකයට සාපේක්ෂව, වසංගතය ආරම්භයේ සිට ශ්‍රී ලංකාව 5%ට වඩා වැඩි විරැකියා අනුපාතිකයක් වාර්තා කර ඇත. එවැනි ජීවනෝපායන් අහිමි වීම, විශේෂයෙන් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් සිටින්නන් සහ සමාජ ආරක්ෂණ ජාලවලින් ආවරණය නොවන්නන්ගේ අවදානම සහ දරිද්‍රතාවය වැඩි කරයි.

2021 වසරේ පළමු භාගයේ දී දක්නට ලැබුණු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි 2020 මාර්තු මාසයේ දී වසංගතය ආරම්භ වීමේ සිට විවිධ ක්‍රම තුළින් මහ බැංකුව මගින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත ලබාදුන් සුවිශේෂී සහාය හේතු විය. පෞද්ගලික අංශය, බැංකු අංශය සහ රජය වෙත ලබාදුන් සහාය මීට ඇතුළත් වේ. කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා තුළින් ඇතිවුණු අයහපත් බලපෑම් යම්තාක් දුරකට සුමටනය කිරීම සඳහා මූල්‍ය අංශය විසින් ව්‍යාපාර සහ පුද්ගලයන් ඇතුළු ණය ලබාගන්නන් සඳහා පුළුල් පරාසයක සහායක් සැපයීය. බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් අයුතු ලෙස දඩ පැනවීම සහ බලහත්කාරයෙන් වත්කම් අත්පත් කර ගැනීම්වලින් ආරක්ෂා කර ගැනීමට ද මහ බැංකුව පියවර ගත්තේය. කෙසේ වෙතත්, අහිතකර සාර්ව ආර්ථික ප්‍රතිවිපාක සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සම්බන්ධ ගැටලු ඇති නොවන ලෙස එවැනි උත්තේජන ක්‍රියාමාර්ග අසීමාන්තිකව නොකඩවා ක්‍රියාත්මක කළ නොහැකිය. ඒ අතරම, ඉදිරියේ දී, අනාගත ණය ඇගයුම් කටයුතුවල දී මූල්‍ය ආයතන සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර සබඳතා පවත්වාගෙන යෑමේ දී වසංගතයෙන් සිදු වූ බලපෑම් හඳුනා ගැනීම අවශ්‍ය වේ.

කොවිඩ්-19 වසංගතය සහ ඒ හා සබැඳි ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම් මගින් ව්‍යාපාර හා පුද්ගලයින් කෙරෙහි කෙටි කාලීනව දැඩි බලපෑම් ඇති කරන අතර, එමගින් මැදි කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ත වර්ධන ගමන් මග හා එහි විභවතාවයට බලපෑම් ඇති කරන විෂම චක්‍රයක් නිර්මාණය කෙරෙන බව ඉහත කරුණු මගින් අවධාරණය කෙරේ. ඉදිරියේ දී, වසංගතය හේතුවෙන් ජීවිත අහිමි වීම් අවම කිරීම සහ දිගු කාලයක් මුළුල්ලේ පවතින මන්දගාමී ආර්ථික වර්ධන තත්ත්වයෙන් මිදීමට දැඩි උත්සාහයක යෙදෙන ශ්‍රී ලංකා ආර්ථිකය මත මෙම තත්ත්වයන් මගින් ඇති කෙරෙන ආර්ථික බලපෑම් අවම කිරීම යන කාරණා ද්විත්වය අතර තුලනයක් පවත්වා ගැනීම සඳහා රජය විසින් පූර්වෝපායිකව සහ සියලු පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රවේශයකින් යුතුව අඛණ්ඩව කටයුතු කරගෙන යෑම අත්‍යවශ්‍ය වේ. රජයේ මූලිකත්වයෙන් දැනට සිදුකෙරෙමින් පවතින කොවිඩ්-19ට එරෙහි එන්නත්කරණ වැඩසටහන මෙම තුලනය පවත්වාගෙන යෑමේ මූලික පදනම වේ. විශේෂයෙන් ම, 2021 වසරේ ජූලි මාසයේ සිට දක්නට ලැබුණු ඉහළ ඇගයීමකට ලක්වූ එන්නත්කරණයේ ප්‍රගතිය තුළින් ඉදිරි කාලයේ දී කොවිඩ්-19 මගින් ඇතිවිය හැකි අවහිරතාවන් අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා නිර්දේශිත සෞඛ්‍ය මාර්ගෝපදේශ මහජනතාව විසින් වඩා හොඳින් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. එමගින් පමණක් ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා සාර්ව සහභාගීත්වයෙන් යුතු සහ තිරසාර ආර්ථික වර්ධන ගමන් මගක් නිර්මාණය කිරීමට මග පාදන, සාර්ව ආර්ථික ස්ථායීතාව, වැඩිදියුණු වූ ආර්ථික වර්ධනය සහ ඉහළ ඔරොත්තු දීමේ හැකියාව යනාදියෙන් සමන්විත වඩාත් යහපත් ආර්ථික චක්‍රයක් නිර්මාණය කළ හැකි වේ.

වන අතර, එය, පෙර වසරේ එම කාලය තුළ වාර්තා වූ 4.3%ක සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගයේ දී 17.9%කින් වර්ධනය විය. 2020 වසරේ මුල් භාගයේ දී වාර්තා වූ 6.9%ක වර්ධනය හා සැසඳීමේ දී, රජයේ පරිභෝජනය 2021 වසරේ පළමු භාගයේ දී 6.7%කින් වර්ධනය විය. 2020 වසරේ පළමු භාගයේ දී 11.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පසුබෑමක් වාර්තා කළ ආයෝජන වියදම, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි 17.3%ක කැපී පෙනෙන වර්ධනය හේතුවෙන්, 2021 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 16.7%කින් වර්ධනය විය. නාමික ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, ආයෝජනය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 23.9% හා සසඳන විට, 2021 වසරේ පළමු භාගයේ දී 24.5%ක් දක්වා ඉහළ ගියේය. භාණ්ඩ හා සේවා සඳහා වන ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ පළමු භාගයේ දී පිරිහී ගියේය. භාණ්ඩ හා සේවා අපනයන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 19.1%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ ද, පවත්නා මිල අනුව ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 29.4%ක වේගවත් වැඩි වීමක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, භාණ්ඩ හා සේවා සඳහා ශුද්ධ විදේශ ශේෂය නාමික ද.දේ.නියේ ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ පළමු භාගයේ වාර්තා වූ -6.9%ක සිට 2021 වසරේ එම කාලසීමාව තුළ දී -9.4%ක් දක්වා පහත වැටුණි.

වසංගතයේ බලපෑම් පිළිබිඹු කරමින්, ශ්‍රම වෙළඳපොළ වෙත අඛණ්ඩව බාධා ඇති වීම් දක්නට ලැබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාපේක්ෂව අඩු ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයක් සහ ඉහළ විරැකියා අනුපාතිකයක් පැවතුණි. 2020 වසරේ සිව්වන කාර්තුවේ 50.1%ක් වූ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය, 2021 වසරේ පළමු කාර්තුවේ දී 50.9%ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. කෙසේ වෙතත්, වසංගතයේ තුන්වන රැල්ල මතු වීමත් සමඟ, 2021 වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 49.8%ක් දක්වා පහත වැටුණි. මේ අතර, වසංගතය ආරම්භයේ සිට අඛණ්ඩව කාර්තු හයක් පුරා විරැකියා අනුපාතිකය 5%ට වඩා ඉහළ මට්ටමක පැවති අතර, 2021 වසරේ පළමු කාර්තුවේ දී සහ දෙවන කාර්තුවේ දී විරැකියා අනුපාතිකයන්, පිළිවෙළින්, 5.7%ක් සහ 5.1%ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2021 වසරේ පළමු භාගය තුළ විරැකියා අනුපාතිකය 5.4%ක් විය.

2021 වසරේ මුල් කාලයේ දී අඩු මට්ටමක පැවති උද්ධමනය, ඉන් අනතුරුව ප්‍රධාන වශයෙන් ආහාර කාණ්ඩයේ උද්ධමනය ඉහළ යෑමත් සමඟ වැඩි වීමක් පෙන්වීය. ගෝලීය වෙළඳපොළ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම නිසා ඉන්ධන ද ඇතුළුව භාණ්ඩ කිහිපයක පරිපාලිත මිල ගණන් ඉහළ දැමුණු අතර,

1.2 රූප සටහන

මතුපිට හා මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තෝරා ගත් ආනයනික භාණ්ඩවල මිල පාලන ද ඉවත් කරන ලදී. ඒ අනුව, කො.පා.මි.ද. (2013=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය, මෑත මාසවල ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී අපේක්ෂිත 4-6% පරාසයේ ඉහළ සීමාව ඉක්මවීය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය ද වැඩි වූ අතර ආහාර කාණ්ඩයේ ඇති ඉහළ බර තැබීම හේතුවෙන් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම නිසා වර්ධනය වන උද්ධමන පීඩන පෙන්නුම් කරමින්, මූලික උද්ධමනයේ ද මෑත මාසවලදී තරමක ඉහළ නැගීමක් පෙන්නුම් කළේය.

කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල ව්‍යාප්තිය සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති වූ සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් ආහාර කාණ්ඩයේ උද්ධමනය ඉහළ ගියේය...

විදේශීය අංශය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අභියෝග හමුවේ විදේශීය අංශයේ අවදානම් ඉහළ නැංවුණු අතර, 2021 වසරේ මේ දක්වා කාලය තුළ රජය සහ මහ බැංකුව විසින් අනුගමනය කරන ලද කාලෝචිත ක්‍රියාමාර්ග විදේශීය අංශයේ බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පවත්වාගෙන යෑමට උපකාරී විය. වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ලද ඉපැයීම් යථා තත්ත්වයට පත් වුවද, ආනයන සඳහා වන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු

1.3 රූප සටහන
වෙළඳ ශේෂය සහ ජංගම ගිණුමේ ශේෂය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1.4 රූප සටහන
දළ නිල සංචිත සහ විනිමය අනුපාතිකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මාසයෙන් අවසන් වූ මාස අට තුළ වෙළඳ හිඟය පුළුල් විය. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.8 හා සැසඳීමේ දී, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී වෙළඳ හිඟය, එ.ජ. ඩොලර් බිලියන 5.5 දක්වා පුළුල් විය. කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන ඇතුළු සියලුම උප අංශයන්ගේම පාහේ හිතකර වර්ධනයන් වාර්තා කිරීමත් සමඟ අපනයන කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයෙන් යථා තත්ත්වයට පත් විය.

> **අපනයනවල කැපී පෙනෙන වර්ධනයට සාපේක්ෂව ආනයන වැඩි වීම හේතුවෙන් 2021 වසරේ මේ දක්වා කාලයේ දී, වෙළඳ හිඟය පුළුල් විය...**

දේශීය ක්‍රියාකාරකම් ඉහළ යෑම මෙන්ම, ගෝලීය මිල ගණන් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස අඛණ්ඩව පැවති ඇතැම් ආනයන සීමා කිරීම් හමුවේ වුවද, ආනයන වියදම ද වර්ධනය විය. විදේශ රැකියා සඳහා පිටත්වීම් අඩුවීම, ගෝලීය සංචාරක ක්‍රියාකාරකම් නැවත ආරම්භ වීම සහ මුදල් ප්‍රේෂණය කිරීම සඳහා අවිධිමත් ක්‍රම වෙත යොමු විය හැකි වීම යන කරුණු හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධන ගම්‍යතාවය මධ්‍යස්ථ විය. කෙසේ වෙතත්, සංක්‍රමණික ප්‍රභවයන් වන රටවල් ක්‍රමයෙන් විවෘත වීමත් සමඟ විදේශ සේවා නියුක්තිය සඳහා සංක්‍රමණිකයින් ලියාපදිංචි වීමේ වැඩි වීමක් මෑත මාසවල දී නිරීක්ෂණය විය.

2020 වසරේ පළමු භාගයට සාපේක්ෂව සෘජු ආයෝජන ව්‍යවසායකයන්ගේ ලාභාංශ ගෙවීම් මෙන්ම, රජයේ විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් සාපේක්ෂ වශයෙන් අඩු වීම හේතුවෙන් 2021 වසරේ පළමු භාගය තුළ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය මධ්‍යස්ථ විය. වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ සංචාරක අංශය තුළ මධ්‍යස්ථ සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් වාර්තා විය. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරට පැවරීමේ අංශයෙහි හිතකර වර්ධනය සේවා අංශයට දායක විය. ගෝලීය සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම හමුවේ වැඩි වූ ප්‍රතිනැව්ගත කිරීම් සහ භාණ්ඩ හැසිරවීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රවාහන අංශයේ ඉපැයීම් ද 2021 වසරේ පළමු භාගයේ දී වර්ධනය විය. 2020 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 1.1ක ජංගම ගිණුමේ හිඟය හා සසඳන විට, 2021 වසරේ පළමු භාගයේ දී ද එය එ.ජ. ඩොලර් බිලියන 1.5ක හිඟයක් වාර්තා කළේය. 2021 වසරේ පළමු භාගය තුළ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සීමා සහිත විය. සෘජු ආයෝජන ව්‍යාපාර සඳහා වූ විදේශ ණය ද ඇතුළු විදේශ සෘජු ආයෝජන 2021 වසරේ පළමු භාගයේ දී මධ්‍යස්ථව පැවතුණි. සාපේක්ෂ වශයෙන් අඩු විදේශ ආයෝජන ගලා ඒම මගින් ගෝලීය සහ දේශීය වශයෙන් වරින් වර කොවිඩ්-19 පැතිරීම නිසා ඇති වූ අවිනිශ්චිතතාවය පිළිබිඹු කරයි. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී චීන සංවර්ධන බැංකුව වෙතින් ලැබුණු ඒකාබද්ධ ණය පහසුකම වසරේ මුල් භාගය තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම විය. මෙම ලැබීම්වලට අමතරව, 2021 වසරේ අගෝස්තු මාසයේ දී මූල්‍ය ගිණුම වෙත ලැබුණු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැණුම් හිමිකම් වෙන්කිරීම, බංගලාදේශ බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම සහ චීන සංවර්ධන බැංකුව වෙතින් ලැබුණු ඒකාබද්ධ ණය පහසුකමෙහි ඉතිරි කොටස සැලකිය යුතු මට්ටමේ මූල්‍ය ලැබීම් විය. මීට අමතරව, මහ බැංකුව චීන මහජන බැංකුවෙන් විදේශ විනිමය හුවමාරු පහසුකමක් ලබාගත් අතර, එය දළ වශයෙන් එ.ජ. ඩොලර්

බිලියන 1.5කට සමාන වන අතර, එම පහසුකම තවමත් භාවිත කර නොමැත. 2021 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් කල්පිරීම ඇතුළුව, 2021 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් මූල්‍ය ගිණුමෙහි ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොටස් වෙළඳපොළ යන දෙඅංශයෙන්ම විදේශ ආයෝජන ක්‍රමයෙන් පිටතට ගලායෑම් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂයෙහි කැපී පෙනෙන හිඟයක් වාර්තා විය. වසංගතය මධ්‍යයේ රජයට ගලා එන සීමිත විදේශ විනිමය සහ අඛණ්ඩ විදේශ ණය සේවාකරණ ගෙවීම් සමඟ, දළ නිල සංචිත 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දක්වා අඩු විය. මේ අතර, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම්, 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.1ක් විය. ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල වැඩි වීම හේතුවෙන් වසර ආරම්භයට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසය අවසානය වන විට වෙළඳපොළ වටිනාකම මත පදනම්ව ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය වැඩි විය.

> ***විදේශ විනිමය ගලා ඒම් සීමිත වුවද, සියලු විදේශ ණය වගකීම් සපුරාලීමට ශ්‍රී ලංකාව අඛණ්ඩව ක්‍රියා කළේය...***

ඉහළ විදේශ විනිමය ගලායෑම් මධ්‍යයේ දේශීය විදේශ විනිමය වෙළඳපොළට ප්‍රමාණවත් ලෙස විදේශ විනිමය ගලා ඒම් සිදු නොවීම හේතුවෙන් 2021 වසරේ ජනවාරි-අප්‍රේල් කාලය තුළ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. විනිමය අනුපාතිකය 2020 වසරේ දෙසැම්බර් මාසය අවසානයේ පැවති එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 186.41 සිට 2021 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 199.54 වෙත ළඟා විය. ඉන්පසුව, ඉහළ ශිෂ්ට ප්‍රයෝග සමඟ අන්තර් බැංකු වෙළඳපොළ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 200ක මට්ටමක පවත්වා ගන්නා ලදී. 2021 වසරේ ඔක්තෝබර් මාසයේ 01 වැනි දින ප්‍රකාශයට පත් කළ *'සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්මෙහි'* සඳහන් වූ පරිදි, අත්‍යවශ්‍ය ආනයනවලට ගෙවීම් සිදු කිරීම සඳහා ද්‍රවශීලතාව සැපයීම මගින් මෑතකදී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළට සැලකිය යුතු ලෙස මැදිහත් විය. එවැනි මැදිහත්වීම්, විනිමය අනුපාතිකය වර්තමානයේ පවතින එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 200ක මට්ටම්වල ස්ථාවර කර ගැනීමට ඉවහල් විය. වසර ආරම්භයේ සිට 2021 වසරේ ඔක්තෝබර් මාසය අවසානය දක්වා එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල 7.7%කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වනවිට ශ්‍රී ලංකා රුපියල ස්ටර්ලින් පවුම, යූරෝ සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ හැසිරීම් මනිනු ලබන නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය, 2021 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසන් වූ මාස දහය තුළ දී පහළ ගියේය. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පදනම් වර්ෂයේ (2017=100) සීමාවට වඩා පහළින් පැවති අතර, එමගින් රටේ වෙළඳ තරගකාරිත්වයට ප්‍රමාණවත් ලෙස සහාය සැපයිණි.

රාජ්‍ය මූල්‍ය අංශය

ප්‍රධාන වශයෙන් වසංගත තත්ත්වයේ අහිතකර බලපෑම් පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ, රාජ්‍ය මූල්‍ය අංශයේ කටයුතු අඛණ්ඩව තවදුරටත් සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දුන්නේය. 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළදී රජයේ වියදම් රුපියල් බිලියන 1,814.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 10.8%කින් ඉහළ ගිය අතර, එම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ආදායම සහ ප්‍රදාන රුපියල් බිලියන 799.8ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 4.5%කින් පමණක් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය පුළුල් වීම හේතුවෙන් මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය ඉහළ ගියේය. විශේෂයෙන් ම, වාණිජ මූලාශ්‍ර ඇතුළු විදේශීය මූල්‍යනය සඳහා ඇති ප්‍රවේශය සීමා වූ අතර, එමගින් රජයේ විදේශ ව්‍යවහාර මුදල් ණය සේවාකරණය කෙරෙහි පීඩනයන් ඇති විය. කෙසේ වෙතත්, මහ බැංකුවේ සහාය ඇතිව රජය විසින් මධ්‍යම රජයේ කල් පිරුණු සියලුම ණය නිසි පරිදි ආපසු ගෙවන ලදී.

> ***සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ වුවද, රජය සුවිශේෂී රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීය...***

1.5 රූප සටහන
රාජ්‍ය ආදායම සහ වියදම (අ)



(අ) 2021 වසර සඳහා වන දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

1.6 රූප සටහන
ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂය (අ)



(අ) 2021 වසර සඳහා වන දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම අභියෝග මධ්‍යයේ වුවද, රජය ලිහිල් බදු ක්‍රමය සහ සමාජ සුබසාධන යෝජනා ක්‍රම අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, වසංගත තත්ත්වය මධ්‍යයේ පුද්ගලයන්ට සෘජු මූල්‍ය ආධාර ලබා දෙමින්, එමගින් සුවිශේෂී රාජ්‍ය මූල්‍ය උත්තේජන සැපයීම හරහා වසංගතයෙන් ආර්ථිකයට ඇති වූ බලපෑම අවම කිරීමට හැකි විය. තවද, රජය කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන සාර්ථකව දිවයින පුරා දියත් කරමින් වසංගතය බොහෝ දුරට පාලනය කළ අතර, ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් වීම තහවුරු කළේය.

2021 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ රාජ්‍ය ආදායම් රැස් කිරීම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 763.2ක (ද.දේ.නි.යෙන් 5.1%ක්) සිට රුපියල් බිලියන 798.9ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 4.9%ක්) දක්වා ඉහළ ගියේය. පෙර වසරේ අනුරූප කාලසීමාවට සාපේක්ෂව ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, එකතු කළ අගය මත බද්ද සහ සෙස් බද්ද මගින් ලද ආදායම් ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය ආදායම වැඩි විය. කෙසේ වෙතත්, පවතින රාජ්‍ය ආදායම් මට්ටම වසංගතයට පෙර පැවති මට්ටම්වලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පවතී.

මේ අතර, 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී වියදම් සහ ශුද්ධ ණය දීම් 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 1,637.9ක (ද.දේ.නි.යෙන් 10.9%ක) සිට රුපියල් බිලියන 1,814.4ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 11.0%ක්) දක්වා ඉහළ ගියේය. රජයේ වියදම් සහ ශුද්ධ ණය දීම්වල මෙම වැඩි වීම මගින්, වසංගතය හේතුවෙන් සිදුවූ පුනරාවර්තන වියදම් මෙන්ම පොලී ගෙවීම් සහ වැටුප් හා වේතනවල ඉහළ යෑම පිළිබිඹු වේ. 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ රාජ්‍ය ආයෝජන 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 192.3ක (ද.දේ.නි.යෙන් 1.3%ක) සිට රුපියල් බිලියන 242.7ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 1.5%ක්) දක්වා වැඩි විය. රාජ්‍ය වියදම් වැඩිවීම රාජ්‍ය ආදායමේ නාමික වැඩි වීමට වඩා විශාල වීම හේතුවෙන් 2021 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ සමස්ත අයවැය හිඟය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 872.6ක (ද.දේ.නි.යෙන් 5.8%ක) සිට රුපියල් බිලියන 1,014.5ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 6.2%ක්) දක්වා පුළුල් විය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කරන වර්තන ගිණුමේ ශේෂය, 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ, 2020 වසරේ අනුරූප කාලය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 694.5ක (ද.දේ.නි.යෙන් 4.6%ක) සිට රුපියල් බිලියන 779.1ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 4.7%ක්) දක්වා වැඩි විය. ප්‍රාථමික ගිණුමේ හිඟය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 288.9ට (ද.දේ.නි.යෙන් 1.9%) සාපේක්ෂව 2021 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ දී රුපියල් බිලියන 377.2ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 2.3%ක්) දක්වා වැඩි විය.

මැදි කාලීනව විදේශීය වගකීම් අඩු කිරීම සඳහා වන රජයේ අපේක්ෂාව පිළිබිඹු කරමින්, අයවැය හිඟය මූල්‍යයනය කිරීමේ දී රජය මුළුමනින්ම දේශීය මූලාශ්‍ර මත පදනම් වූ අතර, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ණය ශ්‍රේණිගත කිරීම පහත හෙළීම හමුවේ සාම්ප්‍රදායික ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත පැවති ප්‍රවේශය සීමා විය. 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී ශුද්ධ දේශීය මූල්‍යනය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 1,067.0ට සාපේක්ෂව රුපියල්

බිලියන 1,204.6ක් ලෙස වාර්තා වූ අතර, විදේශීය මූල්‍යනය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 194.5ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 190.1ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. ශුද්ධ දේශීය මූල්‍යනය සඳහා මහ බැංකුවේ දායකත්වය, 2021 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ පසුගිය වසරේ එම කාලය තුළ පැවති 17.5%ට සාපේක්ෂව 45.6%ක් දක්වා ඉහළ ගියේය. ඉහළ ගිය වියදම් දැරීමට සහ ණය සේවාකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉතිහාසයේ පෙර නොවූ මට්ටමින් මූල්‍ය පහසුකම් සපයමින් මහ බැංකුව රජයට සහයෝගය දැක්වීය. 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 15,117.2ක් වූ මධ්‍යම රජයේ ණය ප්‍රමාණය 2021 වසරේ ජූලි මාසය අවසානය වන විට දී රුපියල් බිලියන 16,751.7ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරීමත් අනෙකුත් විදේශීය ණයවල ශුද්ධ ණය ආපසු ගෙවීමත් හේතුවෙන් මධ්‍යම රජයේ නොපියවූ ණයෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය ප්‍රමාණය අඩු විය. 2021 වසරේ ජූලි මාසය අවසන් වන විට මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණයවල සාපේක්ෂ දායකත්වය 2020 වසර අවසානයේ පැවති 40.0%ට සාපේක්ෂව 38.4%ක් දක්වා අඩු විය.

> ***සමස්ත ණයෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය ප්‍රමාණය 2020 වසර අවසානයේ දක්නට ලැබුණු මට්ටම්වල සිට 2021 වසරේ ජූලි මාසය අවසන් වන විට තවදුරටත් අඩු විය...***

මුදල් අංශය

ආර්ථිකය නැවත නගා සිටුවීමට පහසුකම් සලසන අතරම වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහාය වීම සඳහා 2020 වසරේ මුල් කාලයේ සිට මහ බැංකුව ක්‍රියාත්මක කරන ලද පෙර නොවූ අන්දමේ මුදල් උත්තේජන ක්‍රියාමාර්ග 2021 වසරේ වැඩි කාලයක් මුළුල්ලේ අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. අඩු පොලී අනුපාතික සහ දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතා මට්ටම්වල ප්‍රතිඵලයක් ලෙස බැංකු පද්ධතිය මඟින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, අවශ්‍යතා ඇති සහ ආර්ථිකයේ ඵලදායී අංශ තවදුරටත් දිරිගැන්වීමේ අරමුණින්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය

1.7 රූප සටහන
නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලබාදීමේ ඉලක්ක හඳුන්වාදෙන ලදී. ඒ අනුව, 2021 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 15.1%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඒ සමඟම රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය ද සීඝ්‍රයෙන් ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට පුළුල් මුදල් සැපයුම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 21.0%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, ආර්ථිකය වෙත දැනටමත් සපයා ඇති විශාල රාජ්‍ය මූල්‍ය සහ මුදල් උත්තේජනවල පසු බලපෑම්හි ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි උද්ධමන පීඩන ඉහළ යෑම ද සලකා බලමින් දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ සහ විදේශීය අංශයේ ඇති වූ අසමතුලිතතා හේතුවෙන් මහ බැංකුව 2021 වසරේ අගෝස්තු මාසය මැද දී දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කළේය. ඒ අනුව, ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය

1.8 රූප සටහන
පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) සහ දේශීය ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මධ්‍යයේ මුදල් ප්‍රසාරණය

කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය සහ ඉන් ආර්ථිකය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි ඇති වූ පෙර නොවූ අන්දමේ බලපෑම හේතුවෙන් ලොව පුරා මහ බැංකුවලට සිය ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ මත එමගින් ඇති කරන බලපෑම අවම කිරීමට හා එම ආර්ථික වසංගතය හේතුවෙන් අර්බුදයකට පත් වීම වැළැක්වීම සඳහා සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති පෙර නොවූ පරිදි ක්‍රියාත්මක කිරීම ඇතුළු සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදු විය. ශ්‍රී ලංකාවේ තත්ත්වය ද මීට වෙනස් නොවීය. ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ව්‍යාප්ත වීම මධ්‍යයේ ආර්ථිකයේ සියලු අංශවලට බලපෑම් ඇති කරමින් 2020 වසරේ මාර්තු-මැයි කාල සීමාව තුළ දී දීප ව්‍යාප්තව ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමට සිදු වූ අතර, ඉන් පසුව වසංගතයේ විවිධ රැලි වරින් වර ඇති වීමත් සමඟ අර්ධ වශයෙන් ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම සහ සංචරණ සීමා පැනවීම තුළින් මිලියන ගණනකගේ ජීවිතවලට සහ ජීවනෝපායන්වලට බලපෑම් ඇති කළේය. සංචරණ සීමා පැනවීම, කර්මාන්ත ශාලා වසා දැමීම සහ දේශීය නිෂ්පාදන කටයුතු නතර කිරීම මගින් අවිනිශ්චිතතා ඉහළ යෑම මෙන්ම දේශීය ඉල්ලුම මත සැලකිය යුතු කම්පනයන් ඇති වීමට හේතු විය. වෙළඳපොළ සහ ආර්ථිකය මත වූ කම්පනයේ බලපෑම අවම කිරීම සඳහා කඩිනම් සහ සැලකිය යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය විය.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වසංගතය ආරම්භයේ දී මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කළේය. ණය ලබා ගැනීමේ පිරිවැය අඩු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කළ අතර, උපරිම සීමා පැනවීම මෙන්ම විශේෂ අඩු පොලී අනුපාතික යටතේ ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම තුළින් ඇතැම් ණය පොලී අනුපාතික පහළ දැමීම ද සිදු කළේය. තවද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම, භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම තුළින් රජයට අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම වැනි සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් දේශීය මූල්‍ය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයූ අතර, එමගින් මූල්‍ය වෙළඳපොළ තුළ වන පීඩනය ලිහිල් කරමින් මූල්‍ය අවශ්‍යතා ඇති ආර්ථිකයේ විවිධ අංශ සඳහා ණය ලබා දීම දිරිමත් කරන ලදී. සහන ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරිකයන්ට සහ පුද්ගලයන්ට තවදුරටත් සහන සැලසූ අතර, නියාමන ලිහිල් කිරීම තුළින් මූල්‍ය ආයතනවලට ද සහාය සලසන ලදී. මීට අමතරව, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය ව්‍යවහාර මුදල් අවශ්‍යතාව සහ වසංගත තත්ත්වය ආශ්‍රිත අවිනිශ්චිතතා මධ්‍යයේ ආරක්ෂණ චේතනාව පදනම්ව ඉහළ ගිය ව්‍යවහාර මුදල් සඳහා වූ ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙලෙස ක්‍රියාත්මක කරන ලද ස්ථායීතාව කේන්ද්‍ර කරගත් සහ වර්ධන හිතකාමී ක්‍රියාමාර්ග තුළින් ශක්තිමත් වූ දේශීය ආර්ථිකය, විශාල ආර්ථික ව්‍යසනයක් වළක්වා ගැනීමට සමත් වූ අතර, ක්‍රමානුකූල ප්‍රගතියක් අත් කර ගනිමින් ආර්ථික ක්‍රියාකාරකම් සහ අපේක්ෂා සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් විය. තවද, ආර්ථිකයේ වඩාත් ඵලදායී සහ අවශ්‍යතා ඇති අංශ සඳහා අඩු පිරිවැයක් යටතේ ණය ලබා දීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණු අතර, එමගින් එහි වර්ධන අපේක්ෂා තවදුරටත් ඉහළ නැංවීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කළ ලෝක ආර්ථික දැක්ම අනුව ගෝලීය වශයෙන් කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහය නොලැබුණි නම් ගෝලීය ආර්ථික පසුබෑම අවම වශයෙන් මීට වඩා තුන් ගුණයකින් විශාල විය හැකිව තිබුණු බවට අදහස් ඉදිරිපත් කර ඇති අතර, එමගින් ප්‍රතිපත්ති උත්තේජන ක්‍රියාමාර්ගවල වැදගත්කම සහ එවැනි ප්‍රතිපත්තිමය සහායක් නොමැතිව සිදුවිය හැකි ආර්ථික හානිය පිළිබඳ අවධාරණය කරයි.

ප්‍රතිපත්තිමය උත්තේජන ක්‍රියාමාර්ග සහ කොවිඩ්-19 එන්නත්කරණය සාර්ථක ලෙස දියත් කිරීම හේතුවෙන් ලොව පුරා ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වීමත් සමඟ ලොව පුරා මහ බැංකු මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇති අතර, ඇතැම් මහ බැංකු වසංගතය ආරම්භයේ සිට ලබා දුන් සහායයන් ආපසු හැරවීමට දැනටමත් පියවර ගෙන ඇත. මීට සමගාමීව, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිරියේ දී ඉල්ලුම මගින් ජනිත වන උද්ධමන පීඩන ඇති වීමේ හැකියාව නිරීක්ෂණය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ මැද සිට මුදල් තත්ත්වය දැඩි වීමට ඉඩ සැලසූ අතර, 2021 වසරේ අගෝස්තු මාසයේ මැද සිට ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවමින් සහ 2021 වසරේ සැප්තැම්බර් මාසයේ 01 වැනි දින සිට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නංවමින් සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අවසන් කරන බවට සංඥා කරන ලදී. තවද, රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික, වෙළඳපොළ මගින් තීරණය වීමට ඉඩ හරිමින් රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසිවල ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම ඵලදා අනුපාතික ද 2021 වසරේ සැප්තැම්බර් මාසයේ මැද සිට ඉවත් කරන ලද අතර, ප්‍රාථමික වෙළඳපොළ වෙන්දේසියේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේ අවශ්‍යතාවය ද සීමා කරන ලදී. මීට අමතරව, දැනට පවතින දැඩි මුදල් තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යෑමේ අරමුණින් දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති හිඟ ද්‍රවශීලතා මට්ටම් මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුව එක් දින සහ කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි අඛණ්ඩව පවත්වාගෙන ගියේය. අවසාන වශයෙන්, දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලියට බලපෑමක් නොවන පරිදි, සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව, වසංගතය අතරතුර රජය වෙත ලබා දුන් සැලකිය යුතු මූල්‍ය සහාය ආපසු හැරවීමේ අවශ්‍යතාව හඳුනාගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව '*සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම*' මගින් දක්වා ඇති පරිදි එවැනි මුදල් උත්තේජන ක්‍රමානුකූලව අඩු කිරීමට කටයුතු කරනු ඇත.

1.1 සංඛ්‍යා සටහන
මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

දිනය	ක්‍රියාමාර්ගය
2020 ජනවාරි 30	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	2020 මාර්තු මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 27	කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වාදෙන ලදී.
2020 අප්‍රේල් 03	2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී.
2020 අප්‍රේල් 16	බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් 10.00% දක්වා අඩු කරනු ලැබූ අතර, පදනම් අංක +300 ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී.
2020 මැයි 06	2020 මැයි 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩු කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.50% දක්වා අඩු විය.
2020 ජූනි 16	2020 ජූනි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින්, 2.00% දක්වා අඩු කරන ලදී.
2020 ජූනි 16	කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 2020 මාර්තු 27 හඳුන්වාදුන් 4.00% පොලී අනුපාතිකයක් යටතේ ලබාදුන් සහන ණය පහසුකම, රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී. (සෞභාග්‍යා පුනරුද සහන ණය පහසුකම - දෙවන අදියර)
2020 ජූලි 09	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී. ඒ අනුව, බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 8.50% දක්වා අඩු විය.
2021 අගෝස්තු 19	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.00% දක්වා වැඩි විය.
2021 අගෝස්තු 19	2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින්, 4.00% දක්වා වැඩි කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා සහ ණය ලබා දීමේ ඉලක්ක පනවන ලදී

- 2020 අප්‍රේ 27 — බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී
- 2020 අගෝ 24 — තෝරා ගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා තවදුරටත් අඩු කරන ලදී
- 2020 නොවැ 26 — දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික හඳුන්වා දෙන ලදී
- 2021 අප්‍රේ 21 — ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක බලපත්‍රලාභී බැංකු සඳහා හඳුන්වා දෙන ලදී

සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා පදනම් අංක 50කින් ද, 2021 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 4.00% දක්වා ප්‍රතිශතාංක 2කින් ද ඉහළ නැංවීය. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ සුවිශේෂී ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් 2020 වසරේ

> **අඩු ණය පොලී අනුපාතිකවල සහාය සහ ණය සඳහා පැවති ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින්, 2021 වසරේ ජනවාරි-අගෝස්තු කාලසීමාව තුළ පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...**

මුල් කාලයේ සිට සැලකිය යුතු ලෙස අඩු වූ වෙළඳපොළ පොලී අනුපාතික, මහ බැංකුවේ දැඩි මුදල් සහ ද්‍රවශීලතා ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දැක්වීම ආරම්භ කළේය.

මූල්‍ය අංශය

වසංගතය හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික තත්ත්ව මධ්‍යයේ, 2021 වසරේ සලකා බලන කාලය තුළදී මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතුණි. ලාභදායීත්වය ඉහළ යෑමත් සමඟ බැංකු අංශයේ වත්කම් වර්ධනය විය. කෙසේ වෙතත්, විදේශ විනිමය ද්‍රවශීලතාව පහත වැටීම සහ ණයෙහි ගුණාත්මකභාවය පිරිහීම හේතුවෙන් බැංකු අංශය අභියෝගවලට මුහුණ දුන්නේය. මේ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් පදනම සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. ඇතැම් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් පාඩු ලැබූව ද, සමස්තයක් ලෙස මෙම අංශයේ ලාභදායීත්වය ඉහළ ගිය නමුත්, අක්‍රීය ණය ඉහළ යෑම සැලකිලිමත් විය යුතු කරුණක් ව පැවතුණි. කෙසේ වෙතත්, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ප්‍රමාණවත් ප්‍රතිපාදන මෙන්ම ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක වාර්තා කළ අතර, එමගින් එම ආයතනවල ශක්තිමත්බව තහවුරු විය. මූල්‍ය අංශයේ දිගු කාලයක් පුරා පැවති ගැටලු මඟහරවා ගැනීම සඳහා මහ බැංකුව විසින් 'මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්ම' නැවත ආරම්භ කරන ලදී. ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් දිරිමත් කිරීම හා මෙම අංශය වෙත අලුතින් ප්‍රාග්ධනය යෙදවීම අරමුණු කරගත්, මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. රක්ෂණ, කොටස් තැරැව්කරුවන්, ඒකක භාර සහ අර්ථසාධක අරමුදල් වැනි මූල්‍ය අංශයේ අනෙකුත් උප අංශ 2021 වසරේ සලකා බලන කාලය තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළේය. මූල්‍ය වෙළඳපොළ සැලකූ විට, ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්ති සහ එම කටයුතුවල බලපෑම් පිළිබිඹු කරමින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව 2021 වසරේ ජූලි මාසයේ දී සැලකිය යුතු ලෙස පහළ ගොස් 2021 වසරේ අගෝස්තු මාසය වන විට සෘණ

අගයක් ගත් අතර, විදේශ විනිමය ලැබීම් අඩු වීම මධ්‍යයේ විදේශ විනිමය ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ පීඩනයට ලක් විය. කෙසේ වෙතත්, ඇතැම් විචලන සහ විදේශ ආයෝජන පිටතට ගලායෑම් හමුවේ වුවද, කොටස් වෙළඳපොළ සැලකිය යුතු කාර්යසාධනයක් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඉහළ අවිනිශ්චිතතා පැවතිය ද මූල්‍ය යටිතල පහසුකම් තුළින් මූල්‍ය අංශයේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු විය.

1.2 ජාත්‍යන්තර ආර්ථික පසුබිම

ආර්ථිකයන් අතර පැහැදිලි විෂමතා පැවතිය ද, ගෝලීය ආර්ථිකය වසංගතයේ බලපෑම්වලින් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, 2020 වසරේ දී 3.1%කින් සංකෝචනය වූ ගෝලීය ආර්ථිකය, 2021 වසරේ දී 5.9%කින් සහ 2022 වසරේ දී 4.9%කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කරනු ලැබ ඇත. එන්නත්කරණය සඳහා ඇති ප්‍රවේශයන් සහ ආර්ථික ප්‍රතිපත්තිමය සහායන්වල පවතින දැඩි විෂමතාවලින් ආර්ථික අපේක්ෂා කෙරෙහි ඇති බලපෑම ප්‍රධාන ගැටලුවක්ව පවතී. දියුණු ආර්ථිකයන්වල සමාහාර නිමවුම, 2022 වසරේ දී එහි පූර්ව වසංගත වර්ධන මාවතට පැමිණ 2024 වසර වන විට පූර්ව වසංගත මට්ටම ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කරන අතර, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි (චීනය හැර) පුරෝකථනය කරන ලද ආර්ථික වර්ධනය, 2024 වසරේ දී පූර්ව වසංගත පුරෝකථනවලට වඩා පහළින් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, දියුණු ආර්ථිකයන් 2021 වසරේ දී, සහ 2022 වසරේ දී, පිළිවෙළින්, 5.2%කින් සහ 4.5%කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඇමෙරිකා එක්සත් ජනපදය, 2020 වසරේ දී වාර්තා වූ 3.4%ක සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ දී 6.0%කින් සහ 2022 වසරේ දී, 5.2%කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. යූරෝ කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම් 2020 වසරේ දී වාර්තා කළ 6.3%ක සංකෝචනයක සිට 2021 වසරේ දී 5.0%ක සහ 2022 වසරේ දී 4.3%ක වර්ධනයක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2020 වසරේ දී 2.1%කින් සංකෝචනය වූ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්, 2021 වසරේ දී 6.4%කින් ද 2022 වසරේ දී 5.1%කින් ද වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීනය සහ ඉන්දියාවේ අපේක්ෂිත ඉහළ වර්ධනය මූලිකවම පදනම් කරගෙන, නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව සඳහා 2021 සහ 2022 වසර වෙනුවෙන්, පිළිවෙළින්, 7.2%ක සහ 6.3%ක ශක්තිමත් වර්ධනයන් පුරෝකථනය කර ඇත. රාජ්‍ය ආයෝජනයන් හි පහළ යෑම හමුවේ වුව ද, චීන ආර්ථිකය 2022 වසරේ දී 5.6%ක් දක්වා මන්දගාමී වීමට පෙර 2021 වසරේ දී 8.0%කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ දී 9.5%කින් සහ 2022 වසරේ දී 8.5%කින් ආර්ථිකය වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති ඉන්දියාවේ ආර්ථික වර්ධන අපේක්ෂාවන් ශක්තිමත්ව පවතී.

1.2 සංඛ්‍යා සටහන

තෝරාගත් මහ බැංකුවල ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම්

%

රට	ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය	2018 අවසානයේදී	2019 අවසානයේදී	2020 අවසානයේදී	2021 ඔක්. 15 වැනි දිනට
ශ්‍රී ලංකාව	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	8.00	7.00	4.50	5.00
	නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	9.00	8.00	5.50	6.00
නැගී එන ආර්ථික					
ඉන්දියාව	ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය	6.50	5.15	4.00	4.00
මැලේසියාව	එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය	3.25	3.00	1.75	1.75
තායිලන්තය	එක්දින ද්විපාර්ශ්වික ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය	1.75	1.25	0.50	0.50
චීනය	එක් අවුරුදු ප්‍රමුඛ ණය අනුපාතිකය	4.35	4.15	3.85	3.85
ඉන්දුනීසියාව	සත් දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය	6.00	5.00	3.75	3.50
පිලිපීනය	එක්දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය	4.75	4.00	2.00	2.00
දියුණු ආර්ථික					
ඇමරිකා එක්සත් ජනපදය	ෆෙඩරල් අරමුදල් අනුපාතිකය	2.25-2.50	1.50-1.75	0.00-0.25	0.00-0.25
එක්සත් රාජධානිය	බැංකු අනුපාතිකය	0.75	0.75	0.10	0.10
යුරෝපා මහ බැංකුව	ප්‍රතිමූල්‍යන අනුපාතිකය	0.00	0.00	0.00	0.00
ජපානය	එක්දින ඒක්ෂණ අනුපාතිකය	-0.10	-0.10	-0.10	-0.10
කැනඩාව	එක්දින අනුපාතිකය	1.75	1.75	0.25	0.25
ඕස්ට්‍රේලියාව	මුදල් අනුපාතිකය	1.50	0.75	0.10	0.10
ස්වීඩනය	ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය	-0.50	-0.25	0.00	0.00

මූලය: අදාළ මහ බැංකුවල වෙබ් අඩවි

2021 වසරේ මේ දක්වා කාලය තුළ ආර්ථිකයන් හි උද්ධමන අනුපාතික ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීමත්, වසංගත තත්ත්වය හමුවේ ගෝලීය සැපයුම් දාමය බිඳ වැටීමත් මේ සඳහා තරමක් දුරකට හේතු විය. වසංගතය හේතුවෙන් ඇති වූ ඉල්ලුම හා සැපයුමේ නොගැලපීම්, ඉහළ යන භාණ්ඩ මිල සහ ඇතැම් රටවල් විසින් පසුගිය වසරේ දී හඳුන්වා දෙනු ලැබූ තාවකාලික බදු කපා හැරීම් කල් ඉකුත් වීම වැනි ප්‍රතිපත්ති ආශ්‍රිත ප්‍රවණතාවලින් වූ ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, ඇතැම් දියුණු ආර්ථික සහ නැගී එන වෙළඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් කිහිපයක පාරිභෝගික මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

ගෝලීය භාණ්ඩ මිල මත වන පීඩනය පෙර අපේක්ෂිත මට්ටමට වඩා වැඩි කාලයක් පුරා පැවතිය හැකි බවට ඇතැම් ප්‍රධාන මහ බැංකු විසින් පුරෝකථනය කර ඇති වාතාවරණයක් තුළ, ගෝලීය උද්ධමනය පිළිබඳ අවිනිශ්චිතතා ඉහළ මට්ටමක පවතී. ඉහළ ආහාර මිල ගණන්, ඉහළ බලශක්ති මිලෙහි පසු බලපෑම් සහ විනිමය අවප්‍රමාණය වීම ආදිය හේතුවෙන්, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මිල මත වන පීඩනය ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2021 වසරේ දී දියුණු ආර්ථිකයන්හි පාරිභෝගික මිල උද්ධමනය 2.8%ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි පාරිභෝගික මිල උද්ධමනය 5.5%ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි පවතින අපේක්ෂාව සමඟ, 2021 වසරේ දී ඛනිජ තෙල් මිල 60%කින් පමණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම, ලෝහ සහ පාරිභෝගික ආහාර මිලෙහි මෑත කාලීන ඉහළ යෑම පිළිබිඹු කරමින් ඛනිජ තෙල් නොවන භාණ්ඩ මිල ගණන් 2020 වසරේ දී පැවැති මට්ටමට වඩා 30%කින් පමණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මහ බැංකුවල පූර්වෝපායික ක්‍රියාමාර්ග මෙන්ම, ගෝලීය සැපයුම් දාමයන්ගේ අපේක්ෂිත වැඩිදියුණු වීමේ ද සහාය ඇතිව, මැදි කාලීනව මිල මත ඇති පීඩනය යම් ප්‍රමාණයකට ලිහිල් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

වසංගතයේ විකාශනය ආශ්‍රිත සැලකිය යුතු අවිනිශ්චිතතා, උද්ධමනය පිළිබඳව වන ඉදිරි දැක්ම සහ ගෝලීය මූල්‍ය තත්ත්වයන්හි වෙනස් වීම්, ගෝලීය ආර්ථිකය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම කෙරෙහි අඛණ්ඩව බලපෑම් එල්ල කරනු ඇත. තවද, දිගින් දිගටම පවත්නා ඉල්ලුම හා සැපයුමෙහි නොගැලපීම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන උද්ධමන පීඩන හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණය අපේක්ෂිත මට්ටමට වඩා වේගවත් වීම මගින් ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි විය හැකිය. මීට අමතරව, මූල්‍ය වෙළඳපොළවල විචලන, ඇතැම් රටවල සමාජ නොසන්සුන්තා, අහිතකර දේශගුණික කම්පන, සයිබර් ප්‍රහාර සහ වෙළඳ හා තාක්ෂණ අර්බුද තීව්‍ර වීම යනාදිය මගින් ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම කෙරෙහි බලපෑම් එල්ල විය හැකිය. එසේ වුවද, එන්නත්කරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ තාක්ෂණය මගින් මෙහෙයවන ඵලදායිතා වර්ධනය වේගවත් කිරීම, ඉදිරි කාලය තුළ දී ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇත.

1.3 අපේක්ෂිත වර්ධනයන්

වසංගතය ශීඝ්‍රයෙන් පාලනය කිරීමේ අරමුණින් ගනු ලබන පූර්වෝපායික ක්‍රියාමාර්ග, එන්නත්කරණ ක්‍රියාවලියේ වේගවත් ප්‍රගතිය, සහ අපනයනාභිමුඛ නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා ඇති අඛණ්ඩ ප්‍රතිපත්තිමය කැපවීම, 2021 වසරේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට සහ ඉන් පසුව ඉහළ වර්ධන මාවතක් පවත්වා ගැනීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්, 2021 වසරේ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා පනවන ලද සංචරණ සීමා හේතුවෙන් ආර්ථික කටයුතු මන්දගාමී වීම නිසා පෙර පුරෝකථනය කළ 6.0%ක වර්ධන වේගය පහළ දමමින් සංශෝධනය කර ඇති අතර, 2021 වසරේ දී ආර්ථිකය 5.0%කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, 2020 වසරේ පළමු භාගයේ දී පනවන ලද ආර්ථික හා සමාජ කටයුතු දැඩි ලෙස සීමා කිරීම හා සසඳන විට 2021 වසරේ දී මේ දක්වා පනවන ලද සංචරණ සීමා එතරම් දැඩි නොවීය. මීට අමතරව, 2021 වසර අවසන් වන විට වයස අවුරුදු 18ට වැඩි සියලුම පුරවැසියන් එන්නත් කිරීම අරමුණු කරගත් රජයේ කොවිඩ්-19 එන්නත්කරණ ව්‍යාපාරය ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාමට තවදුරටත් පහසුකම් සපයනු ඇත. මේ අතර, රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලට අනුපූරක ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ ඔක්තෝබර් 01 දින ප්‍රකාශයට පත් කරන ලද *'සය මාසික පෙර දැක්ම'* මගින්, ආර්ථික ක්‍රියාකාරකම්වල කෙටි කාලීන මෙන්ම මැදි හා දිගු කාලීන පුනර්ජීවනයක් ඇති කිරීම අරමුණු කර ගනිමින්, ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් හා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ යුතු බහුවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවයට සහාය වෙමින්, ආයෝජකයින්ගේ විශ්වාසය ශක්තිමත් කිරීමට සහ ව්‍යාපාර සිදු කර ගෙන යෑමේ පරිසරය වැඩිදියුණු කිරීමට මෙම පියවර උපකාරී වනු ඇත.

> ***ආර්ථිකයේ මැදි කාලීන හා දිගු කාලීන වර්ධන මාවත සවිමත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ...***

ආර්ථික ක්‍රියාකාරකම් විශාල වශයෙන් විවිධාංගීකරණය කරමින් අපනයනාභිමුඛ නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා දැනට රජය විසින් දරන අඛණ්ඩ ප්‍රයත්න මත මැදි කාලීන ආර්ථික වර්ධන මාවත කේන්ද්‍රීය වනු ඇත. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය සහ හම්බන්තොට කාර්මික කලාපය වැනි කාර්මික කලාප සංවර්ධනය වැනි මහා පරිමාණ ආයෝජන හරහා ඉදිරි කාලය තුළ දී අත්‍යවශ්‍ය විදේශ ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට හැකිවනු ඇත. රජයේ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු තුළින් රටේ ආදායම් විෂමතා අවම කිරීමට සහ සාර්ව සහභාගිත්ව වර්ධනය ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෑත කාලීන ස්ථායිකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් අනතුරුව, පශ්චාත් වසංගත අවධියේ දී අපේක්ෂිත ඉහළ වර්ධන මාවත තුළ වැඩි රැකියා අවස්ථා, උසස් ජීවන තත්ත්වයන් සහ තිරසාර වර්ධනයක් නිර්මාණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් ලැබෙන සහාය ඔස්සේ ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් වී මැදි කාලීනව 5.0%ට වඩා වැඩි වේගයකින් ස්ථාවර වර්ධනයක් අත්කරගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් රටේ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සැමට අත්විඳිය හැකි බව සහතික කෙරේ. කෙසේ වෙතත්, වසංගතය මධ්‍යයේ අත් විඳි උග්‍ර වූ අවදානම්වලින් මිදීම සඳහා දිගු කාලයක සිට අවශ්‍යව තිබූ ආර්ථික වර්ධනයට සහාය වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම රටට වැදගත් වේ.

සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් වීමට සමගාමීව, අපනයන ප්‍රවර්ධනය සහ ණය නොවන විදේශ මුදල් ලැබීම් ආකර්ෂණය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල සහායයෙන් විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉදිරි කාලය තුළ දී වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයන සම්බන්ධ විකල්ප නිෂ්පාදන ක්‍රියාවලියෙහි දක්නට ලැබූ ඉහළ යෑම ආනයන වියදම් යම් ප්‍රමාණයකට අඩු කිරීමට උපකාරී විය හැකි වුව ද, දේශීය ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ ආනයන සීමා කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ලිහිල් කිරීම සමඟ ගෝලීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම හා සැපයුම් පාර්ශ්වීය අවහිරතා හේතුවෙන් බලශක්ති සහ වෙනත් භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මගින් ඉදිරි කාලය තුළ ආනයන වියදම් ඉහළ යා හැකිය. කෙසේ වෙතත්, 2021 වසරේ මේ දක්වා දක්නට ලැබුණු වෙළඳ භාණ්ඩ අපනයනවල කැපී පෙනෙන වර්ධනය ඉදිරි කාලසීමාව තුළ ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් වෙළඳ හිඟය යම් ප්‍රමාණයකට සමනය වනු ඇත. ඇතැම් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම කෙරෙහි රජය විසින් අවධානය යොමු කිරීම දැඩි කිරීම තුළින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී අපනයන ක්ෂේත්‍රයේ වර්ධන වේගය පවත්වා ගැනීමට අවශ්‍ය සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ භාණ්ඩ අංශයට අමතරව රජය, සේවා වෙළඳාම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සක්‍රීයව ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටියි. තවද, ජාතික වෙළඳ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම, දැනට සිදු කරමින් පවතින යටිතල පහසුකම් සංවර්ධන කටයුතු, විශේෂ ආර්ථික කලාප පිහිටුවීම සහ ප්‍රධාන වෙළඳ හවුල්කාර රටවල්/කලාප සමඟ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීම මගින් මැදි කාලීනව ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන හැකියාව පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

> ***අපේක්ෂිත විදේශ විනිමය ගලා ඒම සමඟ ඉදිරි කාලය තුළ විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ...***

ගෝලීය වශයෙන් සංචාරක කටයුතු වර්ධනය වීම සහ දිවයින පුරා එන්නත්කරණ වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමත් සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීමත් සමඟ සංචාරක අංශය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය වශයෙන් සංචාරක කටයුතු වර්ධනය වීම සහ ගෝලීය ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත් වීම හේතුවෙන් ශ්‍රමය සඳහා වන ඉල්ලුම වැඩි වීමත් සමඟ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල නිරීක්ෂණය කළ මට්ටම්වලට සාපේක්ෂව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකය ස්ථාවර වීම සහ විධිමත් හා අවිධිමත් වෙළඳපොළ අතර විනිමය අනුපාතිකවල වෙනස අඩු වීම මගින් විධිමත් මාර්ග හරහා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හැකි වනු ඇත. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකවලින් පිළිබිඹු වන පරිදි, ශ්‍රී ලංකා රුපියලේ තරගකාරීත්වය වර්ධනය වීම සහ වෙළඳ භාණ්ඩ අපනයන සහ සේවා වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට විශේෂයෙන් ම විවිධ අංශ

සඳහා වූ කාර්ය සාධක බලකායන් හරහා රජය දරන ප්‍රයත්නය හේතුවෙන් වෙළඳ ශේෂය මෙන්ම විදේශීය ජංගම ගිණුමේ ශේෂය ද ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස මැදි කාලීනව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

> *මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද 'සය මාසික පෙර දැක්ම' මගින් කෙටි කාලයේ සිට මැදි කාලය දක්වා විදේශීය අංශයේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා උපාය මාර්ග දක්වා ඇති අතර, ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය යථා තත්ත්වයට පත්කිරීම ඉලක්ක කර ඇත...*

විදේශ විනිමය හුවමාරු ගිවිසුම්, විදේශ විනිමය කාලීන ණය පහසුකම්, රජය වෙත ලැබෙන ව්‍යාපෘති ණය සහ උපාය මාර්ගික නොවන වත්කම්වලින් මුදල් ඉපැයීම වැනි අපේක්ෂිත ලැබීම් සමග ඉදිරි කාලය තුළ දී මූල්‍ය ප්‍රවාහයන් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විදේශීය සෘජු ආයෝජන ව්‍යාපෘති කිහිපයක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම ව්‍යාපෘති කඩිනම් කෙරෙමින් පවතී. ඉදිරි කාලසීමාව තුළ ගෙවුම් තුලනයේ අපේක්ෂිත වැඩිදියුණු වීම තුළින් රටේ විදේශීය වත්කම් ශක්තිමත් වනු ඇති අතර, දළ නිල සංචිත ඉහළ යෑම සහ විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය ද ශක්තිමත් වනු ඇත. දළ නිල සංචිත, 2021 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 3.5ක් පමණ සහ 2022 වසරේ දී සාමාන්‍යයෙන් එ.ජ. ඩොලර් බිලියන 4.0ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසංගතය හේතුවෙන් මූල්‍ය ප්‍රවාහ කෙරෙහි ඇති වූ බාධා මධ්‍යයේ 2021 වසරේ දී අයවැය හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කළ ද, නිසි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය මැදි කාලීනව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් රජයේ ආදායම් රැස් කිරීම මැදි කාලීනව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, මැදි කාලීනව ඵලදායී රාජ්‍ය ආයෝජන සඳහා අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම සඳහා අපේක්ෂිත වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග උපකාරී වනු ඇත. රජයේ මැදි කාලීන ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති පරිදි, වැඩිදියුණු වූ රජයේ ආදායම් සහ තාර්කීකරණය වූ වියදම්වලට සමගාමීව අයවැය හිඟය මැදි කාලීනව ක්‍රමානුකූලව අඩු කිරීමට අපේක්ෂිතය. අයවැය හිඟය අඩු කිරීම හා සමගාමීව වර්තන ගිණුමේ ශේෂයන් සහ ප්‍රාථමික ශේෂයන් ද මැදි කාලීනව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් රජයේ ණය ඒකාග්‍රතාකරණ ප්‍රයත්නවලට සහාය ලැබෙනු ඇත. ඒ අනුව, මැදි කාලීනව ද.දේ.නි.යෙහි අනුපාතයක් ලෙස මධ්‍යම රජයේ නොපියවූ ණය පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ආර්ථික වර්ධනයෙහි සිදු වන වැඩිදියුණු වීම් ද ඒ සඳහා සහාය වනු ඇත. රජයේ මූල්‍යන උපායමාර්ගය තුළින් රජයේ විදේශීය ණය වෙත යොමු වීම අඩු කිරීමට අපේක්ෂිත අතර, එමගින් විදේශ ණය සේවාකරණය සම්බන්ධයෙන් පවතින අවදානම් අවම කිරීමට සහාය සැපයෙනු ඇත. 2019 වසර අවසානයේ දී ද.දේ.නි.යෙන් 17.9%ක් ලෙස වාර්තා වූ නොපියවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වගකීම්, 2021 වසර අවසන් වන විට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 16.0%ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය මැදි කාලීනව ද.දේ.නි.යෙන් 10%ක් පමණ දක්වා තවදුරටත් පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

2021 වසරේ අගෝස්තු මාසය මැද සිට පවතින දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්ව හේතුවෙන්, ඉදිරි කාලය තුළදී වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටම්වල ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම මගින් පොලී අනුපාතික පසුගිය කාලයේ පැවති ඉහළ මට්ටම් දක්වා නැවත වැඩි වනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. පෞද්ගලික අංශයට තිරසාර ලෙස ණය ගලා යෑම සඳහා සහාය වීමට වෙළඳපොළ ණය පොලී අනුපාතික තරගකාරී මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර තැන්පතු පොලී අනුපාතික මගින් ඉතිරිකරන්නන්හට මූර්ත ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳපොළ ණය පොලී අනුපාතික ඉහළ ගිය ද, ආර්ථිකයේ ඵලදායී සහ අවශ්‍යතා ඇති අංශ වෙත ණය ලබා දීම ඉහළ යෑම තුළින් ණය ප්‍රසාරණය වීම ඉදිරි කාලසීමාව තුළ අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ සාධක සහ ගෝලීය භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඇතැම් වෙළඳපොළ භාණ්ඩවල සිල්ලර මිල ගණන් ඉහළ යෑම නිසා නුදුරු කාලයේ දී උද්ධමන පීඩන වැඩි වී මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටම්වලින් විතැන් විය හැකිය. ඒ අනුව, ඉදිරි මාස කිහිපය තුළ උද්ධමනය 8-9%ක් පමණ ඉහළ පරාසයක පවතිනු ඇතැයි ද, ඉන්පසුව උද්ධමනය අපේක්ෂිත 4-6%ක මට්ටම දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. නුදුරු කාලයේ දී ඇති විය හැකි සැපයුම් අංශයේ තාවකාලික පීඩන වළක්වාලීමට රජය විසින් කාලීන පියවර ගැනීම අවශ්‍ය අතර, එමගින් මැදි කාලීන උද්ධමන අපේක්ෂා මත ඇති විය හැකි බලපෑම

වළක්වා ගැනීමට හැකි වේ. මහ බැංකුව සතු රාජ්‍ය සුරැකුම්පත් තොගය ක්‍රමයෙන් අඩු කිරීම හා සමගාමීව, මහ බැංකුව මගින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග ඉල්ලුම් අංශයෙන් ඇති විය හැකි උද්ධමන පීඩන අඩු කිරීමට උපකාරී වනු ඇති අතර, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ පූර්වෝපායික ක්‍රියාමාර්ග ගැනීම තුළින් මැදි කාලීනව මතුපිට උද්ධමනය 4-6% අතර පවත්වා ගැනීම සඳහා මහ බැංකුව කැප වී සිටියි.

වසංගතයේ අහිතකර බලපෑම්වලින් අනතුරුව ආර්ථිකය නව සාමාන්‍ය තත්ත්වයකට ක්‍රමයෙන් හැඩගැසීමත් සමඟ ඉදිරි කාලය තුළ බැංකු අංශය සිය වර්ධන ගම්‍යතාවය පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන සහන කාලය අඩු කිරීම අක්‍රීය ණය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අතර, එය බැංකු පද්ධතියේ ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි ධනාත්මක ලෙස බලපානු ඇත. රටේ විදේශ සංචිත ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ බැංකු අංශයේ විදේශ විනිමය ද්‍රවශීලතාව මත වන පීඩන ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2022 වසර අවසානය වන විට සපුරාලිය යුතු වැඩි කළ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා නව ප්‍රාග්ධනය රැස් කිරීම සහ ලාභ රඳවා තබා ගැනීම වැනි බැංකු අංශයේ ස්ථායීතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග මගින් බැංකුවල ප්‍රාග්ධන මට්ටම් වැඩිදියුණු කිරීම් සහ බැංකු අංශයේ අනාගත වර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ස්වාරක්ෂක සපයනු ඇත. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ, ගැටලු නිරාකරණ රාමුව ශක්තිමත් කිරීමට සහ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර සම්බන්ධ නීති පිළිබඳ ඇති වන ගැටලු විසඳීම සඳහා මුදල් ව්‍යාපාර පනත සහ මූල්‍ය කල්බදු පනත සංශෝධනය කෙරෙමින් පවතී. තවද, යහපාලනය ප්‍රවර්ධනය කිරීමට සහ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය හරහා තාක්ෂණය මත පදනම් වූ මූල්‍ය අතරමැදිකරණය සඳහා පහසුකම් සැලසීමට නියාමන රාමුව ශක්තිමත් කෙරේ. ඒකාබද්ධ කිරීම සඳහා වූ ප්‍රධාන සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් ශක්තිමත් සහ ස්ථායී බලපත්‍රලාභී මුදල් සමාගම් 25ක් ඇති කිරීමට සහ මැදි කාලීනව මෙම අංශයේ ප්‍රාග්ධන මට්ටම් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

> ***"වසංගතයෙන් පසු අවධියේ දී ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම, නව සාමාන්‍ය තත්ත්වයට වේගයෙන් අනුවර්තනය වීමට ආර්ථිකයේ ඇති හැකියාව මත බොහෝදුරට රඳා පවතින අතර, සියලුම පාර්ශ්වකරුවන් විසින් නොබියව ගනු ලබන ක්‍රියාමාර්ග මෙම අනුවර්තනය සඳහා අත්‍යවශ්‍ය වේ...***

ආර්ථිකය වෙත ලබා දුන් සුවිශේෂී රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති උත්තේජන, කොවිඩ්-19 වසංගතයට එරෙහි දීප ව්‍යාප්ත එන්නත්කරණ වැඩසටහන ශීඝ්‍රයෙන් ක්‍රියාවට නැංවීම සහ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම, ශ්‍රී ලංකා ආර්ථිකයේ කෙටි කාලීන වර්ධන අපේක්ෂා ඉටු කර ගැනීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, වසංගතයෙන් පසු අවධියේ දී ආර්ථිකයේ අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාව හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගනිමින් ඉහළ හා තිරසාර වර්ධන මාවතක් ළඟා කර ගැනීම, නව සාමාන්‍ය තත්ත්වයට වේගයෙන් අනුවර්තනය වීමට ආර්ථිකයේ ඇති හැකියාව මත බොහෝදුරට රඳා පවතී. ආර්ථිකයේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රායෝගික සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාවට නැංවීමට ආර්ථිකයට හැකියාව ලබා දෙමින් සියලුම පාර්ශ්වකරුවන් විසින් නොබියව ගනු ලබන ක්‍රියාමාර්ග මෙම අනුවර්තනය සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් කෙටි කාලීන හැඩ ගැසීම්වලට අදාළව පිරිවැයක් නිර්මාණය වුවද, දිගු කාලීනව සමස්ත ආර්ථිකයට එමගින් අත්වන ප්‍රතිලාභ ඉදිරි කාලය තුළ දී එම පිරිවැය අභිබවනු ඇත.